# UNIVERSITY OF PERADENIYA
# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
## දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - DECEMBER 2017
## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - දෙසැම්බර් 2017

### දේශපාලන විද්‍යාව/Political Science
### දේශපාලන හා සමාජ න්‍යාය / Political and Social Theory (PSG: I)

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු සංඛ්‍යාවක් ලැබේ.
මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **10** කි.
ප්‍රශ්න **05කට පමණක්** පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
කාලය: පැය **තුනයි.**

---

01 දේශපාලන හා සමාජ න්‍යායෙහි ස්භාවය හා වැදගත්කම පරීක්ෂා කරන්න.

02 රාජ්‍ය පිළිබඳ න්‍යායෙහි සංවර්ධනය අරබයා ප්ලේටෝ කළ දායකත්වය ගැන අදහස් දක්වන්න.

03 "ශාන්ත තෝමස් ඇක්වයිනාස් ක්‍රිස්තියානි ඇරිස්ටෝටල් වශයෙන් සැලකේ" ඔබ එකඟ වන්නේද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

04 සමාජ සම්මුති න්‍යාය සම්බන්ධ තෝමස් හොබ්ස්ගේ අදහස් විස්තර කරන්න.

05 "නිකොලෝ මැකියාවෙලි යනු නූතන දේශපාලන න්‍යායේ අරම්භකයාය." සාකච්ඡා කරන්න.

06 පහත සදහන් සංකල්ප අතරින් ඕනෑම එකක් ගැන විවේචනාත්මක රචනයක් ලියන්න.

1 සමානාත්මතාව.

2 නිදහස.

3 ප්‍රජාතන්ත්‍රවාදය.

07 රාජ්‍ය සම්බන්ධ මාක්ස්වාදී අදහස් විවේචනාත්මකව විභාග කරන්න.

08 "දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුවත් ඇතැම් දේශපාලන ක්‍රම විග්‍රහ කිරීම සඳහා පැසිස්වාදය අදාළ වේ." ඔබ එකඟ වන්නේද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

09 ස්වාධිපත්‍ය සම්බන්දයෙන් ජීන් බෝඩින්ගේ අදහස් විස්ලේෂණය කරන්න.

10 පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1 මනෝරාජික සමාජවාදය.

2 රෝම නීතිය සම්බන්ධ සියෙරෝගේ අදහස්.

3 ජෝන් ලොක්.

4 පෞද්ගලික දේපල.

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

# GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - DECEMBER 2017
ශාස්ත්‍රවේදි සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - දෙසැම්බර් 2017

## දේශපාලන විද්‍යාව/Political Science
## ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමය / Government of Sri Lanka (PSG: II)

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු සංඛ්‍යාවක් ලැබේ.
මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **10** කි.
ප්‍රශ්න **05කට පමණක්** පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
කාලය: පැය **තුනයි.**

---

01 ලංකා ජාතික සංගමයේ අභිප්‍රායන් සහ ජයග්‍රහණයන් විචාරයට ලක් කරන්න.

02 කොල්බෲක් නිර්දේශ ශ්‍රී ලංකාවේ දේශපාලන වර්ධනය කෙරෙහි කවර ආකාරයෙන් කවර ප්‍රමාණයකට සහාය වූයේද ?

03 "ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වර්ධනය තුල වඩාත් වැදගත් සිදුවීම වූයේ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දීමය" විභාග කරන්න.

04 සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුකාරවරයාගේ භූමිකාව සාකච්ඡා කරන්න.

05 වර්තමාන පාර්ලිමේන්තුවේ බලතල සහ කාර්යයන් 1972 ව්‍යවස්ථාව යටතේ පැවති ජාතික රාජ්‍ය සභාවේ බලතල සහ කාර්යන් සමග සසඳන්න.

06 වර්තමාන ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වභාවය පිළිබඳව අදහස් දක්වන්න.

අ.පි.බ.

07 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පවතින සමානුපාතික නියෝජන ක්‍රමයට එරෙහිව ඉදිරිපත්කරන ලද තර්ක විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

08 ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල සංවිධානය පිළිබඳව කෙටි රචනයක් ලියන්න.

09 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ පවතින ව්‍යවස්ථානුකූල පාලන ක්‍රමය අර්ධ ජනාධිපති ක්‍රමයක් ලෙසින් විස්තර කර තිබෙන්නේ ඇයි ?

10 දහනම වන ව්‍යවස්ථා සංශෝධනයේ මූලික ලක්ෂණ විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

******

# UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - DECEMBER 2017
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - දෙසැම්බර් 2017

### දේශපාලන විද්‍යාව/Political Science
### රාජ්‍ය පරිපාලනය / Public Administration (PSG: III)

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු සංඛ්‍යාවක් ලැබේ.
මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **10** කි.
ප්‍රශ්න **05කට පමණක්** පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
කාලයඃ පැය **තුනයි.**

---

01 "රාජ්‍ය පරිපාලනය හැදෑරීම" යන මැයෙන් රචනයක් ලියන්න.

02 රාජ්‍ය පරිපාලනය හා දේශපාලනය අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

03 ව්‍යාපාරික පරිපාලනය හා රාජ්‍ය පරිපාලනය අතර ඇති සමතා හා විසමතා ගෙන හැර දක්වන්න.

04 විද්‍යාත්මක කළමනාකරණ න්‍යායේ මූලික ලක්ෂණ පැහැදිලි කොට එයට එරෙහිව ඉදිරිපත්ව ඇති විවේචන පැහැදිලි කරන්න.

05 "මානව කළමනාකරණය කළහොත් අවිධිමත් සංවිධානය සංවිධාන අරමුණු අත්පත් කර ගැනීමට කළමනාකරුවාට උපකාර කරයි " සාකච්ඡා කරන්න.

06 නිලබල ක්‍රමයේ මූලික ලක්ෂණ පැහැදිලි කොට වර්තමාන රාජ්‍ය අංශයෙහි කළමනාකරණයේහිලා එහි ඇති අදාළත්ව පැහැදිලි කරන්න.

07 බ්‍රිතාන්‍ය සිවිල් සේවය ප්‍රතිසංස්කරණයේහිලා ෆුල්ටන් කමිටුවේ යෝජනා පැහැදිලි කරන්න.

08 ශ්‍රී ලංකාවේ පළාත් සභාවල බලතල හා කාර්යභාර්ය ගැන රචනයක් ලියන්න.

09 යහ පලනනුශසනයේ (යහ පාලනය) මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.

10 පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1 එල්ටන් මායෝ.

2 හැසිරවීමේ ප්‍රමාණය.

3 ධුරාවලිය.

4 එක් ස්වාමියා හෙවත් එක් ජ්‍යෝෂ්ඨයා.